**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව - 2023**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබුණු රු.1,890,700 ක් වටිනා ගොඩනැඟිලි සහ ඉඩම් වැඩිදියුණුකිරීම් වෙනුවෙන් වැයකර තිබුණු මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 ගිණුම් පිළියෙල කිරිමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ මිලදීගෙන තිබුණු රු.4,394,212 ක වටිනාකම යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.469,300 ක් වූ සනීපාරක්ෂක උපකරණ සහ රු.68,778 ක් වූ විදුලි උපාංග ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විවිධ වියදම් රු.1,183,812 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි. | 2024 ගිණුම් පිළියෙල කිරිමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | හිඟ ආදායම් අයකරගැනීම සම්බන්ධයෙන් අධිකරණයේ පවතින නඩු කටයුතු දෙකක් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නඩු කටයුතු පිළිබඳ විස්තර ගිණුම තුළ ඇතුළත් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව්කිරීම් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම්, වගකීම් සහ ආදායම් විෂයයන් 06 ක මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන අනුව ශේෂය සහ උපලේඛන අනුව ශේෂය අතර රු.9,224,986 ක වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ සැසඳීමක් කර නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.89,862,707 ක වත්කම් හා වගකීම් විෂයයන් 08 කට අදාළ තක්සේරු වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී වත්කම් වලට අදාල උපලේඛන හා අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ සනාථ කරගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත | | | |
| | 24 වගන්තිය | ප්‍රාදේශීය සභාව පාරවල් සහ පටු මංමාවත් පිළිබඳ නාම ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන නොතිබුණි. | ආයතනයේ අදහස් දක්වා නොමැත. | සභාවට අයත් වත්කම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 104 (4) | 2022 දෙසැම්බර් 09 දින අනතුරට පත්වී තිබුණු කැබ් රථය සම්බන්ධයෙන් අනතුර සිදු වී මාස 12කට වැඩි කාලයක් ගත වී තිබුණද, පූර්ණ වාර්තාව පිළියෙල කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92 | සභාවට අයත් වාහන 14 ක රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම වාහන බඳෙහි සටහන් කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම වාහනයේ යෙදීමට කටයුතු කරන බව. | සභාව සතු සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කර තිබිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු14,251,679 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,196,570 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය | ඇස්තමන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 3,006,119 | 3,620,519 | 2,886,334 | 734,185 | 2,759,810 | 3,238,446 | 2,009,918 | 1,228,528 |
| (ii) | කුලී | 4,206,100 | 5,253,537 | 4,486,651 | 766,886 | 2,619,900 | 2,691,367 | 2,254,307 | 437,060 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 837,100 | 2,331,937 | 2,331,937 | - | 781,350 | 1,050,661 | 1,215,506 | (164,845) |
| (iv) | වෙනත් ආදායම් | 6,761,750 | 11,025,736 | 10,785,366 | 240,370 | 3,940,569 | 4,630,231 | 4,417,207 | 213,024 |
| | එකතුව | 14,811,069 | 22,231,729 | 20,490,288 | 1,741,441 | 10,101,629 | 11,610,705 | 9,896,938 | 1,713,767 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 04කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි කඩකුලී රු.441,272 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | අධිකරණයේ නඩු පවරා ඇති අතර ඉදිරියේදී කඩ කුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි කඩ කුලී අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.4,400,170 ක් හා මුද්දර ගාස්තු රු.17,558,078 ක් ගෙන්වාගෙන නොතිබුණි. | විවිධ අවස්ථාවන් වලදී මෙම මුදල් පියවීමට ඉල්ලීම් කර ඇතත් මෙම ගාස්තු අයකර ගැනීම් නිරන්තර ප්‍රමාදයක් පවතින බව. | හිඟ හිටි උසාවි දඩ සහ මුද්දර ගාස්තු ගෙන්වාගත යුතුය. |
| (ඇ) | උඩ විහාරගල නැරඹුම් මැදිරිය සහ එහි වැසිකිලිය සම්බන්ධයෙන් 2019, 2020 සහ 2021 වර්ෂ 03 සඳහා 2019 පෙබරවාරි 06 දින බදු ගිවිසුමකට එළඹ බාහිර පාර්ශවයකට බදුදී තිබුණි. බදු ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ බදු රු.297,276 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලියෙන් රු.12,000 ක මුදලක් අයකරගෙන ඇති බව. | හිඟ බදු ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී රු.1,892,539 ක් වැය කර කසළ ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය රැස්කිරීමේ ගබඩා කාමරයක් කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ ඉදිකර තිබුණද, කසළ ප්‍රතිචක්‍රීකරණය කටයුතු ආරම්භ කර නොතිබුණි. ඒ හේතුවෙන් රැස්කරන නොදිරන කසළ මධ්‍යස්ථාන භූමියේ අවිධිමත් ලෙස ගොඩ ගසා තිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු මඟහැරවීමට කටයුතු කරන බව. | කසළ කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු කළ යුතුය |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මැයි මස 28 වන දින සිදුවී තිබුණු වාහන අනතුර සම්බන්ධව රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය නොකළ මූල්‍ය පාඩුව වූ රු.80,000 ක් සහ සියයට 25 ක් වන රජයේ අමතර ගාස්තුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බව. | ප්‍රතිපූර්ණය නොකළ මූල්‍ය පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 මාර්තු 31 දින සභා අරමුදල් යටතේ බෝක්කුවක් ඉදිකිරීමට සහ පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියකට අත්තිකාරම් ලෙස රු.110,000 ක් අනුමත සමිතියකට ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කර්මාන්ත ඉටු කර නොතිබුණු අතර, අත්තිකාරම්ද පියවා නොතිබුණි. | ව්‍යාපෘති නිමවුම් වටිනාකම සහිත බිල්පතක් ඉදිරිපත් කර ඇති බව. | අත්තිකාරම් ලබා ගත් කාර්යයන් ඉටු කිරීමට හෝ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි උඩ දියලුම ඇල්ල ආශ්‍රිත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් බවට 2022 දෙසැම්බර් පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී තීරණය කර තිබියදී උඩ දියලුම ඇල්ල සංචාරක කලාපය තුළ පිහිටි අක්.13 රූඩ්.02 පර්.03 ක ඉඩම මැනුම් කර සිතියම් ගත කිරීමට සභා අරමුදලින් රු.187,000 ක් වැය කර තිබුණි. | ඉඩමේ අයිතිය නිරවුල් කර දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කළද මේ වන තෙක් ප්‍රතිචාර දක්වා නොමැති බව. | ඉඩම පවරාගෙන සංවර්ධන කටයුතු සිදු කළ යුතුය. |